**තිරසාර විදුලි බල අංශ සහාය ව්‍යාපෘතිය - 2016**
**-------------------------------------------------------------**

තිරසාර විදුලි බල අංශ සහාය ව්‍යාපෘතියේ 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය හා ආසියානු සංවර්ධන බැංකුව (ආසබැ) අතර 2011 ජූනි 20 දින එළඹි අංක 2733 එස්ආර්අයි (එස්එෆ්) හා අංක 2734 එස්ආර්අයි (එස්එෆ්) දරන ණය ගිවිසුම්වල IV ව්‍යවස්ථාවේ 4.05 (අ) සහ 4.03(අ) ව්‍යවස්ථා සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී.

**1.2 ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් යෙදවීම හා ව්‍යාපෘති කාලය**
**------------------------------------------------------------------------------**

ව්‍යාපෘතියේ ණය ගිවිසුම් අනුව, විදුලි බල සහ පුනර්ජනනීය බලශක්ති අමාත්‍යාංශය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරවීමේ නියෝජිතායතනය වේ. ව්‍යාපෘතියේ 1 සිට 6 සහ 9 සිට 10 කොටස් සඳහා ලංකා විදුලි බල මණ්ඩලය ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය වන අතර 7 සහ 8 කොටස් සඳහා සුනිත්‍ය බලශක්ති අධිකාරිය ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය වේ. ව්‍යාපෘතියේ 01 සිට 06 සහ 09 සිට 10 කොටස් යටතේ ලංකා විදුලි බල මණ්ඩලය විසින් ක්‍රියාත්මක කරනු ලබන කාර්යයන් පිළිබඳ මාගේ නිරීක්ෂණයන් මෙම වාර්තාවේ ඇතුලත් වේ. ව්‍යාපෘතියේ අරමුණු වනුයේ, විශ්වාසදායී , ප්‍රමාණවත් සහ දැරිය හැකි විදුලි බල සැපයුම ආවරණය වන ප්‍රදේශය පුළුල් කිරීම සඳහා සහ (අ) නැගෙනහිර, උතුරු මැද, දකුණු හා ඌව පළාත්වල සම්ප්‍රේෂණ පද්ධතිය ශක්තිමත් කිරීම (ආ) නැගෙනහිර හා ඌව පළාත්වල ග්‍රාමීය විදුලි සැපයුම පුළුල් කිරීම සහ (ඇ) බලශක්ති කාර්යක්ෂමතාවය වැඩිදියුණු කිරීම සහ පුනර්ජනනීය බලශක්තිය පිළිබඳ වැඩිදුර සංවර්ධනය මඟින් සේවා බෙදා හැරීමේදී කාර්යක්ෂමතාවය සහ විශ්වාසදායී බව වැඩිදියුණු කිරීමයි.

ව්‍යාපෘති පරිපාලන අත්පොත අනුව, ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත මුළු පිරිවැය රු.මිලියන 18,135.45 කට සමාන එජඩො මිලියන 162.03 ක් වන අතර ඉන් සියයට 72.9 ක් නියෝජනය වන රු.මිලියන 13,223.84 කට සමාන එජඩො මිලියන 118.07 ක් සැපයීමට ආසියානු සංවර්ධන බැංකුව එකඟවී තිබුණි. ඉතිරි මුදල වන රු.මිලියන 4,707.36 කට සමාන එ.ජ.ඩො. මිලියන 42.03 හෙවත් සියයට 26 ක් ශ්‍රී ලංකා රජය මඟින් දායක වීම සඳහා එකඟ වී තිබුණි.2011 නොවැම්බර් 17 දින ව්‍යාපෘතිය එහි කටයුතු ආරම්භ කරන ලද අතර 2014 අප්‍රේල් 30 වන විට නිම කිරීමට සැලසුම් කර තිබුණි.
මුළු ණය මුදලින් ඉතිරිය භාවිතා කිරීම සඳහා ව්‍යාපෘතියේ විෂය පථය පුළුල් කර ඇත. පසුව ණය කාලසීමාව 2016 ඔක්තෝම්බර් 30 දින දක්වා දීර්ඝ කරන ලදි. කෙසේ වුවද, ව්‍යාපෘතියේ ක්‍රියාකාරකම් 2016 දෙසැම්බර් 31 දක්වා සිදු කරමින් පැවතුණි.

**1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම**
**-------------------------------------------------------------**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක, සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

**1.4 විගණකගේ වගකීම**
**----------------------**

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදුකරන ලදි. ආචාර ධර්මවල අවශ්‍යතාවයන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම් කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි. මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ

හෙළිදරව් කිරීම්වලට උපකාරිවන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටින්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරු කිරීම්ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරිමට අදාළ වන්නාවූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් ව්‍යාපෘතියේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ.

මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි. පහත සඳහන් දෑ තක්සේරු කිරීමෙහිලා අවශ්‍ය යැයි සලකනු ලැබූ එවැනි පරික්ෂා කිරීම්ද එම පරික්ෂණයට ඇතුළත් විය.

(අ) අභ්‍යන්තර පාලන අංශයෙන් බලන කල, ව්‍යාපෘති කළමනාකරණය පිළිබඳ සතුටුදායක පාලනයක් සහ ව්‍යාපෘතියේ මෙහෙයුම්වලට අදාළ පොත්පත්, වාර්තා ආදියෙහි විශ්වාසවන්තභාවය තහවුරු වනු පිණිස පද්ධති සහ පාලන ප්‍රමාණවත් වූයේද යන බව.

(ආ) ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන වියදම් ව්‍යාපෘතිය විසින් පවත්වා ගෙන යන ලද වැඩිදියුණු කළ මූල්‍ය වාර්තා හා ප්‍රගති වාර්තා සමඟ සතුටුදායක ලෙස සසඳා තිබුණේද යන බව.

(ඇ) ශ්‍රී ලංකා රජය සහ ණය සපයනු ලබන නියෝජිතායතනය විසින් සපයන ලද අරමුදල්වලින් දරන ලද ව්‍යාපෘති වියදම්, මූල්‍ය හා භෞතික වශයෙන් ව්‍යාපෘතියේ ප්‍රගතිය, ව්‍යාපෘතියේ මෙහෙයුම් කටයුතුවලින් උද්ගත වූ වත්කම් සහ වගකීම් , ණයවලින් කරන ලද මිලදී ගැනීම් හඳුනා ගැනීම ආදිය දැක්වෙන පරිදි අඛණ්ඩ පදනමක් මත ප්‍රමාණවත් ගිණුම් වාර්තා පවත්වා ගනු ලැබුවේද යන බව.

(ඈ) ණය යටතේ ආපසු ගැනීම් ණය ගිවිසුම්වල දක්වා ඇති පිරිවිතරයන්ට අනුකූලව සිදුකර තිබුණේද යන වග.

(ඉ) ණය ගිවිසුම්වල දක්වා ඇති අවශ්‍යතාවයන්ට අනුකූලව ප්‍රතිපූර්ණයන් සඳහා වූ ඉල්ලුම් පත්‍ර සනාථ කිරීම සඳහා ඉදිරිපත් කරන ලද වියදම් ප්‍රකාශ කෙරෙහි සාධාරණ ලෙස විශ්වාස තැබිය හැකිද යන බව.

(ඊ) ණය යටතේ සපයන ලද අරමුදල්, ද්‍රව්‍ය හා උපකරණ ව්‍යාපෘතියේ අරමුණු සඳහා උපයෝජනය කර තිබුණේද යන බව.

(උ) ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා අනුගමනය කරන ලද වර්ගීකරණයට අනුව වියදම් නිවැරදිව හඳුනාගෙන තිබුණේද යන බව.

(ඌ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති පදනම් කර ගෙන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර තිබුණේද යන බව, සහ

(එ) පෙර වර්ෂයේ විගණන වාර්තාවෙන් පෙන්වා දෙන ලද කරුණු නිවැරදි කර ගැනීම සඳහා කළමනාකරණය විසින් සතුටුදායක ක්‍රියාමාර්ග ගෙන තිබුණේද යන බව, සහ

(ඒ) ණය ගිවිසුම් වල දක්වා ඇති මූල්‍ය සම්මුතීන්වලට අනුකූල වූයේද යන බව.

**1.5** **තත්ත්වාගණනය කළ විගණන මතය සඳහා පදනම**

-----------------------------------------------------------------------

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

**2.** **මූල්‍ය ප්‍රකාශන**

----------------

**2.1** **මතය**

------------

මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු සහ පැහැදිලි කිරීම් අනුව, මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් උද්ගතවන ගැලපීම් වලින් ඇති වන බලපෑම හැර, මා දරන්නාවූ මතය වනුයේ,

(අ) 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ව්‍යාපෘතිය නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බව හා 2016 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘතියේ ක්‍රියාකාරිත්වය පිළිබඳ තත්ත්වය සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව,

(ආ) සපයන ලද අරමුදල් ඒවා සපයනු ලැබූ කාර්යයන් සඳහා උපයෝජනය කර තිබුණු බව,

(ඇ) ණය ගිවිසුමේ දක්වා ඇති අවශ්‍යතාවයන්ට අනුකූලව ප්‍රතිපූර්ණයන් සඳහා වූ ඉල්ලුම් පත්‍ර සනාථ කිරීම සඳහා ඉදිරිපත් කරන ලද වියදම් ප්‍රකාශ කෙරෙහි සාධාරණ ලෙස විශ්වාසය තැබිය හැකි බව,

(ඈ) මාගේ පෙර වර්ෂයේ විගණන වාර්තාවෙන් පෙන්වා දෙන ලද කරුණු නිවැරදි කර ගැනීමට කළමනාකරණය විසින් සතුටුදායක ක්‍රියාමාර්ග ගෙන තිබුණු බව, සහ

(ඉ) ණය ගිවිසුම් වල දක්වා ඇති මූල්‍ය සම්මුතීන්වලට අනුකූල වී තිබුණු බවත්ය.

**2.2** **මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

-----------------------------------------

**2.2.1** **ගිණුම්කරණ අඩුපාඩු**

------------------------

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) වටිනාකම රු.මිලියන 2,198.91 ක්වූ නිම කරන ලද සිවිල් වැඩ හා ලංකා විදුලි බල මණ්ඩලයට මාරු කරන ලද පිරිවැය රු.මිලියන 489.39 ක්වූ මෝටර් වාහන, ව්‍යාපෘතියේ වත්කම් ලෙස ගිණුම්ගත කර තිබුණු අතර රු.මිලියන 233 ක්වූ ක්ෂය ව්‍යාපෘතියේ වියදමක් ලෙස දක්වා තිබුණි.

(ආ) ව්‍යාපෘතියේ ප්‍රතික්‍රියා විදුලිබල කළමනාකරණය යටතේ රු.මිලියන 368.51 ක් වූ කෙරීගෙන යන වැඩ වටිනාකම වර්ගීකරණ දෝෂයක් හේතුවෙන් ගාල්ල නව විදුලි බල සම්ප්‍රේෂණ සංවර්ධන වැඩ යටතේ ඉදිරිපත් කර තිබුණි.

(ඈ) සැපයුම් කොන්ත්‍රාත්තුව පසුව අවලංගු කර අත්තිකාරම් මුදල් සෘජුවම ණය දෙන ආයතනය වෙත ආපසු යවා තිබුණද,මෝටර් රථ 03 ක් සැපයීම පිළිබඳව රු.මිලියන 2.45 ක අත්තිකාරම් මුදලක් බාහිර පාර්ශවයක් වෙත ව්‍යාපෘතියේ සිවිල් ඉදිකිරීම් වැඩෙහි නිරත වී සිටින කොන්ත්‍රාත්කරු හරහා සැපයීමට සලසා තිබුණ අතර එය ව්‍යාපෘතියේ වියදමක් ලෙස දක්වා තිබුණි.

## 3. මූල්‍ය හා භෞතික කාර්යසාධනය

### 3.1 අරමුදල් උපයෝජනය

මූල්‍යයනය, සමාලෝචිත වර්ෂය සඳහා අයවැයගත ප්‍රතිපාදනය සහ සමාලෝචිත වර්ෂය තුළ සහ 2015 දෙසැම්බර් 31 දක්වා අරමුදල් උපයෝජනය පිළිබඳ වැදගත් සංඛ්‍යා ලේඛන කිහිපයක් පහත දැක්වේ.

| ප්‍රභවය | ණය ගිවිසුම අනුව මූල්‍යයනය සඳහා එකඟවූ මුදල | | සමාලෝචිත වර්ෂය සඳහා අයවැය ඇස්තමේන්තුවේ කරන ලද වෙන්කිරීම | උපයෝජනය කළ අරමුදල් සමාලෝචිත වර්ෂය තුළ | | උපයෝජනය කළ අරමුදල් 2015 දෙසැම්බර් 31 දිනට | |
|---|---|---|---|---|---|---|---|
| | එජඩො මිලියන | රු. මිලියන | රු. මිලියන | එජඩො මිලියන | රු. මිලියන | එජඩො මිලියන | රු. මිලියන |
| ආසබැ | 118.11 | 13,223.84 | 1,817.00 | 14.43 | 2,157.00 | 81.30 | 12,156.00 |
| ශ්‍රීලංර | 43.92 | 4,911.61 | - | - | - | - | - |
| ලංවිම | - | - | 138.00 | 0.25 | 37.00 | 12.95 | 1,936.00 |
| | 162.03 | 18,135.45 | 1,955.00 | 14.68 | 2,194.00 | 94.25 | 14,092.50 |

ඉහත තොරතුරු අනුව, ව්‍යාපෘති කාලසීමා අවසානයට ව්‍යාපෘතියේ මුළු වෙන් කිරීම් වන රු.මිලියන 13,223.84 කට සමාන එ.ජ.ඩො. මිලියන 118.11 කින් සියයට 69 ක් නියෝජනය වන රු.මිලියන 12,156.50 කට සමාන එ.ජ.ඩො. මිලියන 81.30 ක් පමණක් උපයෝජනය කර තිබුණි.

### 3.2 භෞතික කාර්ය සාධනය

ලබාගත හැකිවූ තොරතුරු අනුව, ගාල්ල නව විදුලි බල සම්ප්‍රේෂණය, උතුරු නැගෙනහිර විදුලි බල සම්ප්‍රේෂණය, ඌව පළාත් ග්‍රාමීය විදුලිබලය ලබාදීම හා බෙදා හැරීම් පද්ධතිය, ප්‍රතික්‍රියා විදුලි බල කළමනාකරණය සහ මොරගොල්ල ජල විදුලි බල මධ්‍යස්ථානයේ දළ වශයෙන් මෙගා වොට් 30 රිවර් හයිඩ්‍රෝපවර් මධ්‍යස්ථානයේ විස්තරාත්මක ඉංජිනේරු සැලැස්මක් 2015 දෙසැම්බර් 31 දිනට නිමකර තිබුණි. මුළු ණය මුදලින් වැය නොවී ඉතිරි වූ රු.මිලියන 1,118.50 ක මුදල කිරිබත්කුඹුර උපපොළ මධ්‍යස්ථානය වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය, ඌව හා අම්පාර ග්‍රාමීය විදුලි බලය ලබාදීම පුළුල් කිරීම හා බෙදා හැරීමේ පද්ධතිය වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය සඳහා ද්‍රව්‍ය සැපයීම හා ප්‍රවාහනය කිරීම සහ සම්ප්‍රේෂණ රැහැන් 02 ක් ප්‍රතිසංස්කරණය සඳහා ද්‍රව්‍ය සම්පාදනය පිණිස උපයෝජනය කිරීමට අපේක්ෂා කෙරුණි.ලැබී ඇති තොරතුරු අනුව, කිරිබත්කුඹුර උපපොළ මධ්‍යස්ථානය වැඩිදියුණු කිරීමේ වැඩ සියයට 67 ක් වී තිබුණු අතර ඌව පළාත හා අම්පාර ග්‍රාමීය විදුලි බලය ලබාදීම හා බෙදාහැරීම් පද්ධතිය වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය සහ සම්ප්‍රේෂණ ඉදිකිරීම් ව්‍යාපෘති අංශය යටතේ

සම්ප්‍රේෂණ රැහැන් 02 ක් ප්‍රතිසංස්කරණය කිරීමසදහා ද්‍රව්‍ය ප්‍රසම්පාදනය කිරීමේදී ලංකා විදුලි බල මණ්ඩලයට මූල්‍යමය දුෂ්කරතා ඇති විය.

**3.3 මූල්‍ය පාලනයේ ගැටළු**

**--------------------------**

පහත නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සිරිතක් ලෙස, ව්‍යාපෘතිය මගින් කරගෙන යනු ලබන සිවිල් වැඩ පිළිබඳ ඉංජිනේරු ඇස්තමේන්තුව අධි තක්සේරු වන අතර සිවිල් වැඩ පිළිබඳ කොන්ත්‍රාත්තු අවම පිරිවැයක් සහිත නොක්ත්‍රාත්කරු වෙත පිරිනමනු ලැබේ.එම කරුණ 2016 ජූලි 18 දිනැති අංක පීඊ/ටීඊඑන්/එස්සීඒපීසී/එස්ජී/2015/41 දරන ලිපිය අනුව විදුලි බල හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍යාංශ ලේකම් විසින් පිළිගනු ලැබුණි. කොන්ත්‍රාත් පිරිවැය අධි ඇස්තමේන්තු කිරීම නිසා රු.මිලියන 1,118.50 ක් වැය නොවී එම දිනට ඉතිරි වී තිබුණි.

(ආ) ලැබී ඇති තොරතුරු අනුව, ව්‍යාපෘතියේ ක්‍රියාකාරකම් ක්‍රියාත්මක කිරීමේ ප්‍රමාදය හේතුවෙන් රු.මිලියන 12.35 ක බැඳීම් ගාස්තු 2016 දෙසැම්බර් 31 දින වන විට නියෝජිත ආයතනය විසින් අයකර ගෙන තිබුණි.

(ඇ) ව්‍යාපෘතියේ ඉතිරි පිරිවැයන්, සම්ප්‍රේෂණ ඉදිකිරීම් කටයුතු සඳහා ලංකා විදුලි බල මණ්ඩලය විසින් ප්‍රසම්පාදනය කරන ලද පිරිවැය රු.මිලියන 497.99 වූ ද්‍රව්‍ය, එම වැඩ සිදු නොකිරීම සහ අධි ඇස්තමේන්තු කිරීම හේතුවෙන් කෙරීගෙන යන වැඩ යටතේ දක්වා තිබුණි. එසේ වුවද, එම වත්කම් සමාලෝචිත වර්ෂය අවසාන වන විටද භාවිතයෙන් තොරව පැවතුණි.

(ඈ) ඉදිරිපත් කිරීමේ දෝෂයක් හේතුවෙන්, සමාලෝචිත වර්ෂයේදී ග්‍රාමීය විදුලි බල සැපයීම සහ බෙදාහැරීම් පද්ධති වැඩිදියුණු කිරීමේ වැඩ යටතේ දරන ලද එකතුව රු.මිලියන 1,087.53 ක් වූ සංවර්ධන වියදම් රු.මිලියන 563.24 කින් වැඩියෙන් දක්වා තිබුණි.